# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1646/20 - 2010 මාර්තු 24 වැනි බදාදා - 2010.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය**

සිවිල් ගුවන් සේවා අධිකාරිය

**196 ගුවන් සංතරණ රෙගුලාසි යටතේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්‍ෂ ජනරාල්වරයා විසින් කෙරෙන දැනුම් දීම**

විධිමත් මගී ගුවන් ප්‍රවාහන සේවාවක් (Scheduled Operations) හා කුලීමෙහෙයුම් ගුවන් ප්‍රවාහන සේවාවක් (Charter Operations) රට තුළ පවත්වාගෙන යාම සඳහා 1955 ගුවන් සංතරණ පනතේ කොන්දේසි වලට අනුකූලව ගුවන් මෙහෙයුම් සහතිකය/ගුවන් සමාගම් සහතිකය හා කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සහතිකය ලබා ගැනීම සඳහා කොළඹ 05, ආර්. ඒ. ද මෙල් මාවත, අංක 3 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත සෙනොක් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් 2010 ජනවාරි මස 25 දාතමින් ඉල්ලුම් පත්‍රයක් 2010 පෙබරවාරි 01 වැනි දින මෙම කාර්යාලය වෙත එවනු ලැබ ඇති බව මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. අයදුම්පතට අනුව සීමාසහිත සෙනොක් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙසේ ය.

සී.එන්.වී සෙල්වනායගම් මහතා

එකී සමාගමේ යෝජිත ගුවන් මෙහෙයුම් කටයුතු පිළිබඳ පූර්ණ වගකීම කළමණාකාරිත්වය සඳහා කීර්ති දිසානායක මහතා සීමාසහිත සෙනොක් එවියේෂන් සර්විසස් (පුද්ගලික) සමාගම විසින් නම් කරනු ලැබ ඇත.

අයදුම්කරුගේ සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කොළඹ 03, අංක 64, ගාලු පාරේ, සිවිල් ගුවන් සේවා අධිකාරියේ බිම් මහලේ පිහිටි තාක්‍ෂණික පුස්තකාලයේ තබා ඇති අතර, ඕනෑම වැඩ කරන දිනක, කාර්යාල වේලාවන් තුළ මහජනතාවට පරීක්‍ෂාකර බැලීමට හැකිය.

යෝජිත මෙහෙයුම් සඳහා අවශ්‍ය ගුවන් මෙහෙයුම් සහතික (Air Operator Certificate), ගුවන් සමාගම් සහතිකය (Airline License) සහ කුලී මෙහෙයුම් ගුවන් ප්‍රවාහන සහතිකය (Charter Operator License) ඇතුළු අනිකුත් අදාළ අනුමැතීන් ප්‍රදානය කිරීමට ප්‍රථම, ගුවන් සංතරණ රෙගුලාසි මෙන්ම අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ උපදේශ ව්‍යවහාර (International Standard and Recommended Practices)සහ මෙම ආයතනය විසින් පිළිගත් ඒ හා සම්බන්ධිත දේශීය අවශ්‍යතාවයන්ට අනුව නිරුපද්‍රිත වූත්, ආරක්‍ෂිත වූත් කාර්යක්‍ෂම වූත් ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් පැවැත්වීම සඳහා අයදුම්කරුවන්ගේ යෝග්‍යතාවය සංස්ථාපිත ක්‍රියාමාර්ගානුකූලව නිසි පරිදි පරීක්‍ෂාකර බලා මෙම අයදුම්පත සහතික කිරීමේ වැඩ පිළිවෙල 2010 අප්‍රේල් මස 20 වැනි දිනට පසුව මවිසින් ආරම්භ කිරීමට තීරණය කර ඇති බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1A - G 12661— 340 (2010/03)

ඉහත පරිච්ඡේදයේ සඳහන් දිනට දින 10 කට ප්‍රථම ඕනෑම පුද්ගලයෙකු හට ඉහත කී අයදුම් පත සම්බන්ධව ලිඛිතව, නිශ්චිත හේතු පදනම් කරගත් කරුණු, ගගන නාවික සංතරණ රෙගුලාසි වලට අනුකූලව මා වෙත සංදේශනය කළ හැකිය. එවැනි සංදේශනයන්හි අන්තර්ගත සියලු ප්‍රකාශන වල නිරවද්‍යතාව ලිඛිත සාක්ෂි සමග ඉදිරිපත් කළ යුතුය. එවැනි සංදේශන මා වෙත ඉදිරිපත් කරන අවස්ථාවේ දී ඔහු/ඇය විසින් එහි පිටපතක් අයදුම්කරුට ලැබීමට සැලැස්විය යුතු අතර, එසේ යැවූ බවට සහතිකයක් අදාළ සංදේශනයට අමුණා තිබිය යුතුය.

පරාක්‍රම දිසානායක,
වැඩ බලන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී.

2010 මාර්තු මස 24 වැනි දින,
කොළඹ 03,
අංක 64, ගාලු පාර,
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය දී ය.

04 - 255

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.